# පාරිසරික ආචාරධර්ම සිද්ධාන්තයක් වන උපයෝගිතා න්‍යාය හා එහි භාවිතය පිළිබඳ  ථෙර-ථෙරීගාථා පාළිය ආශ්‍රිත විමර්ශනාත්මක අධ්‍යයනයක්

මීගොඩ පඤ්ඤාරතන හිමි[1]

## හැඳින්වීම

නූතනයෙහි ඉතා ශීඝ්‍රයෙන් දියුණු වන ලෝකය අභිමුව අභියෝග රාශියක් ගොඩ නැගී තිබෙන අතර තත් අභියෝගයන්හි මූලය වශයෙන් මනුෂ්‍ය ක්‍රියාකාරම්වලපවත්නා අමනෝඥ භාවය දැක්විය හැකිය. එහිදීහඳුනාගත යුතු වැදගත්ම සාධකයක් වන්නේ පරිසරයයි. පරිසරය පිළිබඳ විවිධ විෂයානුබද්ධව හා ආගමික සන්දර්භයන්ට අනුව අර්ථකථනයන් රාශියක් හඳුනාගත හැකිය. පරිසරය කෙරෙහි බුදුදහම තුළින් ද විවිධ ප්‍රවේශයන් රාශියක් හඳුනාගත හැකි වන අතර අපගේ මෙම අධ්‍යයනය පාරිසරික ආචාරවිද්‍යාව හා බුදුසමය අතර ඇති කරුණු කෙරෙහි යොමු වේ. පාරිසරික ආචාරවිද්‍යාව මනුෂ්‍ය ක්‍රියාකාරකම් නිසා විනාශ වී යන පරිසරය සුරක්ෂිත කරනු සඳහා ගොඩ නැඟුණු විෂයයක් වන අතර එහි පවත්නා මූලධර්මයන් හා බුදුසමයෙහි ථේරගාථා පාළියෙහි දී රහතන් වහන්සේලාගේ ප්‍රකාශයන් ඔස්සේ විද්‍යමාන වේ. එමගින් පැහැදිලි වන්නේ බුදුන් වහන්සේස්වකීය ශ්‍රාවක පර්ෂදය පරිසර හිතැති පිරිසක් බවට පත් කොට තිබෙන බවයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික හා ද්විතීයික යන උභය මූලාශ්‍රය භාවිතයෙන් සිදු කරන ලද මෙම පර්යේෂණයේදී ප්‍රධාන වශයෙන් පාරිසරික ආචාරවිද්‍යාව නමැති විෂයෙහිදී සංවර්ධනය වූ උපයෝගිතා න්‍යාය පිළිබඳ  කරුණු ගවේශනය කරනු ලැබුවෙමි. එහිදී පාරිසරික ආචාරවිද්‍යාව ආශ්‍රිතව විරචිත ද්විතීයිකමූලාශ්‍ර පදනම් කර ගනිමින් ගවේශනය කරන ලද තත් කරුණු  බුදුසමය හා තුලනය කිරීමේදී ථෙරගාථා පාළිය හා පරමත්ථදීපනී නම් තදට්ඨකථාව භාවිත කරනු ලැබූවෙමු.

[1] පාලි විශේෂවේදී උපාධි අපේක්ෂක, පාලි හා බෞද්ධ අධ්‍යන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
mpannarathana123@gmail.com

**සාකච්ඡා**

පරිසරය යන වචනය සඳහා නිර්වචනයක් සැපයීමේදී වඩාත් සරලව හඳුනාගත හොත් මිනිසා ඇතුළුව ඔහු වටා පවතින සියලුම ජීවී අජීවී වස්තූන් යනුවෙන් දැක්විය හැකිය. පරිසරය සම්බන්ධයෙන් විවිධ පර්යේෂණයන් සිදු කරන ලද විවිධ උගතුන්ගේ මතය වන්නේ මේ ආශ්‍රිතව ප්‍රධාන කොටස් දෙකක් යටතේ විග්‍රහ කළ හැකි බවයි. එනම්,

I. ස්වාභාවික පරිසරය

II. සංස්කෘතික පරිසරය යනුවෙනි.

මෙම විභජනයෙහි පළමු වැන්නෙන් අජීවී පරිසරයත් දෙවැන්නෙන් මිනිසාගේ අවශ්‍යතා සම්පූර්ණ කරගැනීම සඳහා හෙතෙමෙ විසින් ගොඩ නගා ගන්නා ලද වටපිටාවත් අදහස් වී ඇත. පරිසරය මූලික වශයෙන් මිනිසා හා බැඳී පවතින සාධකයක් වන බැවින් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පරිසරය පිළිබඳ ව අධ්‍යනයන් සිදු වී තිබෙන අතර බුදුසමයෙහි ද පරිසරය හා එහි භාවිතය මෙන්ම උපයෝගීතාවය ආශ්‍රිතව ද කරුණු විද්‍යමාන වේ.

තාක්ෂණික දියුණුවත් සමගින් ඉතා ශීඝ්‍ර වශයෙන් දියුණුවට පත් වන නූතන ලෝකය මුහුණ දී තිබෙන ඉතා ප්‍රබල අර්බුදක් වන්නේ පාරිසරික විනාශයයි. තත් අර්බුදය විසර්ජනය කරනු වස් ලොව පුරා උගතුන් විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග අතුරින් ප්‍රධානතම ක්‍රියාමාර්ගය වූයේ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පරිසරය අධ්‍යයනය කිරීමයි. එහිදී ප්‍රතිඵලය වූයේ පාරිසරික අධ්‍යාපනය නමින් විෂයයක් බිහි වීමත් ඒ වටා උපවිෂයයන් රාශියක් පරිසරවේදය , පාරිසරික දර්ශනය , පාරිසරික ආචාර විද්‍යාව ආදී වශයෙන් බිහි වීමයි. මෙහිදී අපගේ විමර්ශනයට බඳුන් වන්නේ පාරිසරික ආචාර විද්‍යාවයි. පාරිසරික ආචාර විද්‍යාවෙහි අරමුණ වන්නේ අනාගතය උදෙසා සුරක්ෂිත කළ යුතු දෙයක් වශයෙන් පරිසරය කෙරෙහි මානවයන් විසින් කවරාකාරයේ සදාචාරාත්මක ක්‍රමවේදයන් භාවිත කළ යුතු ද යන්න පිළිබඳ ව විමර්ශනය කිරීමයි. මෙම පාරිසරික ආචාරවිද්‍යාව කෙරෙහි විවිධ ආගම්වල ඉගැන්වීම් උපයෝගී කර ගැනීමට ඇති හැකියාව, යුනෙස්කෝ සංවිධානය මගින් දියත් කරන ලද තිරසාර සංවර්ධනයක් උදෙසා පාරිසරික දර්ශනය හා සාරධර්ම ආශ්‍රිත ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද වැඩසටහන් තුළින් වඩාත් අවධාරණය විය. එමගින් ලොව පුරා උගත්හු බුදුසමය ආශ්‍රිත පාරිසරික දර්ශනය හා ආචාර ධර්ම පිළිබඳ ව වඩාත් උනන්දුවක් දක්වන්නට වූහ. එය මෙම පර්යේෂණයන්හි මූලාරම්භක අවස්ථාව වශයෙන් දැක්විය හැකිය.

පාරිසරික ආචාර ධර්ම සිද්ධාන්ත පිළිබඳ කරුණු දැක්වීමේදී බටහිර පාරිසරික ආචාරධර්ම විෂයානුබද්ධ සිද්ධාන්ත හා බුදුදහමෙහිලා විද්‍යමාන සිද්ධාන්ත වශයෙන් ප්‍රධාන කොටස් දෙකක් යටතේ දැක්විය හැකිය. බටහිර ආචාරධර්ම සිද්ධාන්තයන්ට අනුව ප්‍රධාන න්‍යායන් දෙකකි.

1. උපයෝගිතා න්‍යාය
2. යුක්ත්‍යාත්ම්‍යතා න්‍යාය වශයෙනි.

නමුත් බුදුසමය ආශ්‍රයෙන් සැලකීමේදී ප්‍රධාන න්‍යායන් 4 ක් හඳුනාගත හැකිය. එනම්

1. උපයෝගිතා න්‍යාය
2. යුක්ත්‍යාත්ම්‍යතා න්‍යාය
3. හොඳ හා නරක පිළිබඳ න්‍යාය
4. සාංදෘෂ්ටික න්‍යාය යනුවෙනි.

මෙහිදී මෙම පර්යේෂණය ගොඩනැගෙනුයේ බටහිර පාරිසරික ආචාර විද්‍යාව තුළදී මෙන්ම බුදුසමය තුළදීද පිළිගන්නා ලද උපයෝගීතා න්‍යාය බුදුසමය තුළ හා පාරිසරික ආචාර විද්‍යාව තුළ අර්ථකථනය වී ඇති ආකාරයත් තත් න්‍යායෙහි උපයෝගීතාවයත් පිළිබඳ කරුණු ගවේෂණයෙහිලා ය. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර භාවිත කරමින් සිදු කරනු ලබන මෙම අධ්‍යනයෙහි දී බුදුසමය ආශ්‍රිත කරුණු දැක්වීමේදී ථෙර-ථෙරීගාථා පාළිය හා පරමත්ථදීපනී නම් වූ තදට්ඨකථාව ද භාවිත කරන ලද්දෙමු.

පරිසරය මනුෂ්‍ය ජීවිතය සඳහා උපයෝගී වන ආකාරය පිළිබඳ ව උපයෝගීතා න්‍යාය තුළින් කරුණු සාකච්ඡා කොට තිබෙන අතර එහිදී ප්‍රමුඛතම අවධානය යොමු වන්නේ අනාගතය සඳහා සුරක්ෂිත කරමින් වර්තමානයෙහි පරිසරය භාවිත කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව කරුණු දැක්වීම කෙරෙහි ය. ථේර ථේරී ගාථා පාළිය ආශ්‍රයෙන් රහතන් වහන්සේලා මේ සඳහා ලබා දී තිබෙන ක්‍රමවේදය මෙහිදී වඩාත් වැදගත් සාධකයක් වශයෙන් හඳුනාගත හැකිය.

ථෙර ථෙරී ගාථා පාළියට අනුව පරිසරයෙහි උපයෝගීතාවය ප්‍රධාන වශයෙන් අරමුණු ද්විත්වයක් උදෙසා භාවිත කොට ඇති ආකාරයක් හඳුනාගත හැකිය. එනම්

1. ආධ්‍යාත්මික විමුක්තිය ගවේෂණයෙහිලා උපස්ථම්භක වන්නක් වශයෙන්
2. ස්වකීය ශාරීරික පැවැත්ම ස්ථාපනය කරනු සඳහා

යනුවෙනි.

පූර්වෝක්ත උපයෝගිතාවන් ද්විත්වයම පාදක කර ගනිමින් බුදුදහම මගින් පරිසරය ඇගයීමට ලක් කොට තිබෙන අතර එමගින් පරිසරය, අනාගතය උදෙසා සුරක්ෂිත කරමින් වර්තමානයෙහි භාවිත කිරීම පිළිබඳ අවධාරණය නිතැතින්ම සිදු වී ඇත.

විශේෂයෙන්ම ආධ්‍යාත්මික විමුක්ති ගවේශනයෙහි නිමග්න වූ බුදුන් වහන්සේ මෙන්ම උන්වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේලා ද අරහත් ආදී ඵලාධිගමනයන් උදෙසා බහුල වශයෙන් ස්වභාවික පරිසරය උපයෝගී කර ගෙන

තිබේ. ප්‍රධාන වශයෙන් බුදුන් වහන්සේගේ ජීවිතය පිළිබඳ සැලකීමේදී උපතේ සිට පරිනිර්වාණය දක්වා සිදුවීම් රාශියක් පරිසරය හා බැඳී පැවති බැව් බුද්ධ චරිතය ආශ්‍රිත මූලාශ්‍ර තුළින් ප්‍රකට වේ. මෙම කරුණ බුදුන් වහන්සේට පමණක් නොව උන්වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේලාට ද වඩාත් පොදු වූවකි. නිදර්ශනයක් වශයෙන් අජකරණී නදිය අසබඩ බවුන් වඩන සප්පක තෙරුන් වහන්සේගේ උදානය දැක්විය හැකිය. උන්වහන්සේගේ උදානය තුළ දක්වා තිබෙන්නේ

"යදා බලාකා සුචිපණ්ඩරච්ඡදා - කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජිතා
එලෙහිති ආලයමාලයෙසිනි - තදා නදී අජකරණී රමෙති මං"

(ථේරගාථා පාළි, 100 පිට)

කළු පැහැති වළාකුළුවලට බියෙන් තැති ගන්නා ලද පිවිතුරු සුදු පියාපත් ඇති කෙකිනි සමූහයකගෙන් ගැවසී ගත් අජකරණී නදිය මා සතුටු කෙරෙයි.

පූර්වෝක්ත උද්ධෘතයට අනුව පැහැදිලි වන්නේ ස්වකීය ආධ්‍යාත්මික සංවර්ධනයේදී පරිසරයෙහි උපයෝගීතාවය ප්‍රධාන වශයෙන් ලැබී තිබෙන බවයි. එහිදී ව්‍යංගාර්ථවත්ව ඉදිරිපත් කරනු ලබන ඉතා වැදගත් කරුණක් ද දැකිය හැකිය. එනම් මෙම සුන්දරත්වය ආරක්ෂා කර ගත යුතු බවත් ය. මෙහිදී සප්පක තෙරුන් පරිසරයට සිදු කරන ලද කිසිදු හානියක් පිළිබඳ තොරතුරක් දක්නා නොලැබෙන අතර උන්වහන්සේ ස්වකීය විමුක්ති සාධනය අතරතුර පාරිසරික වින්දනය ලබන ලද ආකාරය පමණක් විද්‍යමාන වේ. එමගින් පොදු ලෝකයාට විශේෂිත ආදර්ශයක් ලබා දී ඇත. එනම් සප්පක තෙරුන් වහන්සේ ලෙස පරිසරය වින්දනය කළ යුතු බවයි.

ථේරගාථා පාළියෙහි සරභඞග තෙරුන් වහන්සේගේ ගාථාවලිය මෙහිදී වෙනත් නිදර්ශනයක් වශයෙන් දැක්විය හැකිය. හීතණ අතින් බිඳ ගෙන පන්සලක් කොටගෙන වාසය කරන ලද බැවින් සරභඞග නම් සම්මුතිය ලබන ලද තෙරුන් වහන්සේ ස්වකීය නාම සම්මුතිය පිළිබඳ ව අදහස් දක්වමින් වර්තමානයෙහි තමන් වහන්සේට එසේ කළ නොහැකි බැව් දක්වා තිබේ.

"න මය්හං කප්පතෙ අජ්ජ සරෙ හත්ථෙහි භඤ්ජිතුං
සික්ඛාපදා නො පඤ්ඤත්තා ගොතමෙන යසස්සිනා"

අද මට හීතණ අතින් බිඳින්නට නො කැප වෙයි. යසස් වී වූ ගෞතම බුදුන් වහන්සේ විසින් අපට ශික්ෂා පද පණවන ලද්දේ වේ.

හී තණ බිඳීමෙන් සිදු වන්නේ පරිසර විනාශයකි. බුදුන් වහන්සේ විසින් ප්‍රාතිමෝක්ෂයේදී එබඳු පරිසර විනාශයන් සිදු වන ක්‍රියාකාරකම් සිදු නොකරන ලෙසට ශික්ෂා පද පනවනු ලැබූහ. සරභඞග තෙරුන් වහන්සේගේ ප්‍රකාශනයෙන් පැහැදිලි වන්නේ බුදුන් වහන්සේ විසින් පාරිසරික සුරක්ෂිතතාව ස්ථාපනය කරනු

වස් පණවා තිබෙන ශික්ෂාපද ආරක්ෂා කිරීම සඳහා භික්ෂූන් වහන්සේලා බැඳී සිටි බවයි.

**නිගමනය**

පූර්වෝක්ත අයුරින් සිදු කරන ලද අපගේ විමර්ශනයෙහි දී නූතන පාරිසරික ආචාරවිද්‍යාව තුළින් ප්‍රකාශයට පත් කොට තිබෙන ආචාරධාර්මික සිද්ධාන්ත බුදුදහම තුළදී බුදුන් වහන්සේ විසින් ස්වකීය ශ්‍රාවකයන් ඔස්සේ ප්‍රායෝගික කොට තිබෙනු ථේරගාථා පාළිය තුළින් හඳුනාගත හැකි වන අතර ඒ අනුව පැහැදිලි වන්නේ පාරිසරික ආචාරවිද්‍යාව නමැති විෂය බිහිවීමට පූර්වයෙන් බුදුන් වහන්සේ විසින් පාරිසරික ආචාරවිද්‍යානුකූල න්‍යායන් භාවිත කොට සේම ස්වකීය ශ්‍රාවකයන් ඔස්සේ ප්‍රායෝගික කොට තිබෙන බවත් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද** - පරිසරය, පාරිසරික ආචාර විද්‍යාව, උපයෝගීතා න්‍යාය, ථේරගාථා පාළිය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*ථේරගාථා හා ථේරිගාථා පාළි.* (2006). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*පරමත්ථදීපනී නාම ථේරගාථට්ඨකථා.* (1918). කොළඹඃ සයිමන් හේවාවිතාරණ මුද්‍රණය.

*පරමත්ථදීපනී නාම ථේරිගාථට්ඨකථා.* (1918). කොළඹඃ සයිමන් හේවාවිතාරණ මුද්‍රණය.

ආරියරත්න, ඉරෝමි.,.(2007).*බෞද්ධ පාරිසරික දර්ශනය හා සදාචාරය.*කොළඹඃ සමයවර්ධන පොත් ප්‍රකාශන.

Silva, De Padmasiri.(1998).*Environmental Philosophy and Ethics in Buddhism*. London: Plagrave Macmillan Publisher.